ශීර්ෂය - 258 මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

-----------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 තත්වාගණනය කළ මතය

------------------------------

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූමූල්‍යප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018දෙසැම්බර් 31 දිනට මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කළමතය සඳහා පදනම

----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සමඟ අනුරූපීවන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අග්‍රිම ගැලපුම් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7 ඡේදය (vi) ප්‍රකාරව අක් මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කළ යුතුය. | අක් මුදල් ගැලපුම් ගිණුමක්පිළියෙලනොවූයේප්‍රමාද දෝෂයකිනි.ඇමුණුමක් ලෙස අක් මුදල් ගැලපුම් ගිණුමක් සකස් කර ඉදිරිපත් කරමි. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරම්වලින් ජනිත වූ මුදල් යටතේ ආදායම් නොවන ලැබීම් ලෙස මුළු අග්‍රිම වටිනාකම වූ රු.5,794,413,673 ක මුදල ඇතුළත් කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ භාණ්ඩාගාර සෘජු අග්‍රිම, වෙනත් ලැබීම් හා පොදු තැන්පත් ඇතුළත් කළ යුතුය. | විගණනයෙන් පෙන්වා දී පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට භාණ්ඩාගාර සෘජු අග්‍රිම, වෙනත් ලැබීම් හා පොදු තැන්පත් ඇතුළත් කර සංශෝධිත ප්‍රකාශයක් පිළියෙල කර ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ අත්තිකාරම් ගිණුම් ශේෂයන් ගැලපීම් ඇතුළත් කර නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ අත්තිකාරම් ගිණුම් ශේෂයන් ගැලපීම් ඇතුළත් කළ යුතුය. | අත්තිකාරම් ගිණුම් ශේෂයන් ගැලපීම් ඇතුළත් කර නොමැත්තේ ප්‍රමාද දෝෂයකිනි. ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරමි. |

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් නොවන ලැබීම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුනිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| i. | භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් යටතේ සෘජු භාණ්ඩාගාර ලැබීම්වලට අමතරව වෙනත් මූලාශ්‍රවලින් ලැබීම් වූ රු.1,103,737,431 ක මුදල ඇතුළත් කර තිබුණි. | ආදායම් නොවන ලැබීම් යටතේ භාණ්ඩාගාර අග්‍රිම දැක්වීමේදී සෘජු භාණ්ඩාගාර ලැබීම් පමණක් දැක්විය යුතුය. | විගණනයෙන් පෙන්වා දීමෙන් පසු ජීසීජ්-එෆ් ආකෘතියක් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| ii. | මාසික ගිණුම් සාරාංශ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් රැස් කරන ලද රු.218,898,042 ක ආදායමක් මූල්‍ය කාර්යසාධනප්‍රකාශනයේ වෙනත් ලැබීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | රැස් කරන ලද ආදායම හඳුනාගෙන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වෙනත් ලැබීම් යටතේ ගිණුම්ගත කළ යුතුය. | ඒසීඒ-එෆ්ආකෘතිය සංශෝධනයකර ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත. |
| iii. | ඉදිරිපත් කරන ලද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය අනුව 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂයක් නොමැති ලෙස දක්වා තිබුණි. | වර්ෂ අවසානයට තිබෙන අග්‍රිම ගිණුම් ශේෂය ගිණුම්වල දැක්විය යුතුය. | ප්‍රමාද දෝශයකින් සිදුවී ඇත. පෙන්වා දීමෙන් පසු සංශෝධිත ඒසීඒ-එෆ් ආකෘතියක් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත. |

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 ක වැඩ තහනම් කළ පුද්ගලයින් 05 දෙනෙකුගෙන් 2019 අප්‍රේල් 30 දිනට අයවිය යුතු රු.375,287 ක ශේෂයක් පැවති අතර ඉන් රු.308,873 ක ණය ශේෂ 04 ක් අවුරුදු 05 ඉක්මවා පැවතුණි. | විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර අදාළ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | රු.375,287ක ශේෂයෙන්එක් නිලධාරියෙකු මියගොස් ඇති බැවින් වැන්දඹු අනත්දරු වැටුපෙන් අයකර ගැනීමටත් තවත් නිලධාරින් දෙනෙකුගෙන්වාරික වශයෙන් අයකරන බවත්, අනෙක් දෙදෙනාගේ විමර්ශණ කටයුතු සිදුවෙමින් පවතී. |
| (ii) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 03 ක සේවය අතහැරගිය කාර්ය මණ්ඩල සාමාජිකයින් 03 දෙනෙකුගෙන් රු.174,526 ක ණය ශේෂයක් අයවීමට තිබූ අතර, ඉන් රු.170,276 ක ණය ශේෂ 02 ක් වර්ෂ 05 ක් ඉක්මවා තිබුණි. | අවශ්‍ය නීතිමය පියවරයන් ගැනීම තුළින් සේවය අතහැරගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | එක් ණය ශේෂයක් මේ වන විට අය වෙමින් පවතින අතර, අනෙක් ණය ශේෂ 02ක නීතිපතිගෙන් විමසා තොරතුරු කැඳවා ඇත. |

(ඇ) දේපල පිරියත හා උපකරණ

---------------------------------

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------------ | ------------------------------- |
| (i) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක පවතින ඉඩම් හා ගොඩනැගිලි සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාසවල අගය මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුළත් කර නොතිබුණි. | ආයතනය සතු සියලු ජංගම නොවන වත්කම්වල පිරිවැය හෝ තක්සේරු අගය මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුළත් කළ යුතුය. | තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇතත් මෙතෙක් පිළිතුරු ලැබී නැත. |
| (ii) | වැරදි නිවැරදි කිරීමට අදාළ රු.350,048,543 ක්වූ ගැලපුම් සටහන්, ඒසීඒ-6 ආකෘතියේ අනෙකුත් ආයතනවලින් වත්කම් අත්පත් කර ගැනීම් ලෙස දක්වා තිබුණි. | අත්පත් කර ගැනීම් යටතේ නිවැරදි අත්පත් කර ගැනීම් වටිනාකම නිරූපණය විය යුතුය. | පිළිගනිමි. |
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනට ඒසීඒ-6 ආකෘතිය අනුව මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනය හාභාණ්ඩාගාර වත්කම් වාර්තාව අනුව රු.1,090,304 ක වෙනසක් පැවතුණි. | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂ, භාණ්ඩාගාර වත්කම් වාර්තාව සමඟ එකඟවිය යුතුය. | වෙනස්කම් පිළිගනිමි. |

(ඈ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය ------------ නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | ------------------------- | ---------- | ------------------- | ------------ | ------------------- |
| | | රු. | | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ------------------------- | | | | |
| | මුදල්රෙගුලාසි177 (i) | - | ප්‍රාදේශිය ලේකම් කාර්යාල6 ක සරප් විසින් රැස් කරන ලද රු.8,337,713 කආදායම අවස්ථා 113 කදි වැඩ කරන | රජයේ ආදායම් දිනපතා හෝ හැකිතාක් කලින් බැංකු ගත කළ යුතුය. | සෑම අවස්ථාවකදීම පසුදින මුදල් තැන්පත් කරනු ලබයි.ප්‍රවාහන පහසුකම් සපයාගත |

| | | | | |
|---|---|---|---|---|
| | | දින 03ත් 14ත් අතර කාල ප්‍රමාදයක් සහිතවබැංකු ගත කර තිබුණි. | | නොහැකි අවස්ථාවල මෙසේ ප්‍රමාදවීම් පවතී. |
| (ii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>-------------------------- | | | |
| | 2016 දෙසැම්බර් 29 - දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | හතරලියද්ද හා පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අයත් වාහන වල ඉන්ධන දහන පරික්ෂාව චක්‍රලේඛයට අනුව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. | හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයචක්‍රලේඛය අනුව 2019 වර්ෂයේ වාහන දෙකෙහි ඉන්ධන දහන පරික්ෂාව සිදු කර ඇති අතර, පස්බාගේ කොරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල වාහනයේ මුල් පරික්ෂාවේ දෝෂයක් ඇති බව නිරීක්ෂණය වීම හේතුවෙන් නැවත කිලෝමීටර් 80 ඉක්මවා ධාවනයෙන් පසුව ඉන්ධන පරික්ෂාව සිදු කරන ලදී. |

(ඉ) වංචනික ස්වරූපයේ ගනුදෙනු
---------------------------------

| විගණන නිරීක්ෂණය<br>--------------------- | නිර්දේශය<br>----------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------------------- |
|---|---|---|
| ගහවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබමින් සිටි පුද්ගලයෙකු අවුරුදු 16 මාස 2 ක කාලයක් මාසිකව විශ්‍රාම වැටුප් 2 ක් ලබාගනිමින් රු.2,064,377 ක වංචාවක් සිදුකර ඇත.මේ තොරතුරු අනාවරණය වී වර්ෂයකට අධික කාලයක් ඉක්ම ගොස් ඇතත්, මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම ගොනුව මාරු කිරීමෙන් පසු අනිවාර්යෙන්ම විශ්‍රාම වැටුප් ලැබූ කාර්යාලයෙන් ඔහුගේ නම ඉවත් නොකිරීම නිසා රු.2,064,377 ක අවභාවිතයක් සිදුව ඇති අතර අදාළ පාඩුව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය. | පරීක්ෂණ මේ වනවිට අවසන් කර ඇති බවත් පරීක්ෂණ වාර්තාව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හා මහනුවර පොලිස් ස්ථානයට 2019 පෙබරවාරි 8 දින යොමුකර ඇති බවත් ඉදිරි කටයුතු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ උපදෙස් මත සිදුකරන බවත් දන්වන ලදී. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැය විෂයයන් 05 ක එකතුව වූරු.78,974,060 ක ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා පිළිගත හැකි හේතුන් ඉදිරිපත් කර නොතිබුණි. | වැය විෂයන් යටතේ ප්‍රතිපාදන ඉතිරි වන්නේ නම් ඒ සඳහා පැහැදිලි හේතුන් ඉදිරිපත් කළ යුතුය. | මෙම ඉතිරිවීම් අනියම් ඉතිරිවීම් බවත් ඉන්ධන අරපිරිමැසුම් සහිතව පරිහරණය කිරීමත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ට අනුව සහ වර්ෂ 2020 වැටුප් වැරදියට ගණනය වීම නිසා සිදුවිය. |

2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2018 වර්ෂය තුළ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුයටතේ රු.5,057,706,170 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණද , වර්ෂය තුළ ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් කිසිදු ලිඛිත ඉල්ලීමක් නොමැතිව රු. 1,505,477,832 ක මුදලක් එනම් සියයට 30 ක් ආපසු පවරාදී තිබුණි.ඉන් රු.1,210,791,832 ක මුදලක් මූලධන ප්‍රතිපාදන ආපසු පවරාදීම් විය. | ලැබෙන ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. | වෙන් කර දී තිබූ ප්‍රතිපාදනයෙන් කටයුතු නිම කළ පසු හා ප්‍රමාද වී ලැබී තිබූ ප්‍රතිපාදන රුපියල් මිලියන 1,510 ආපසු පවරා දෙන ලදි. |

(ආ) <u>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| i. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 7 ක විශ්‍රාමිකයන්ගේ මරණය පිළිබඳව වසම භාර ග්‍රාම නිලධාරී විසින් දින 11 ත් දින 109ත් අතර කාල පමාවකින් පසුව දැනුවත් කිරීම් කර තිබුණි. | විශ්‍රාමිකයෙකු මිය ගිය විගස දින 7 ක් ඇතුළත ග්‍රාම නිලධාරී විසින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දැනුවත් කළ යුතුය. | ග්‍රාම නිලධාරීන්වෙත කොට්ඨාශ දින රැස්වීම්වලදී දැනුවත් කිරීම් කර ඇති අතර, අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් අනුගමනය කිරීමට කටයුතු යොදා ඇත. |
| ii. | උඩුනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2018 ජනවාරි සිට ජූනි දක්වා විශ්‍රාමිකයින්ගේ නොගෙවන ලද රු.377,859 කවිශ්‍රාම වැටුප්, | මිය ගිය විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් අධිභාර කර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවිය යුතුය. | වරද හඳුනාගත් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක දැනුවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා වෙත යවා නොතිබුණි. | | |
| iii. | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 4 ක විශ්‍රාමිකයින් 26 දෙනෙක් වෙනුවෙන් නොගෙවන ලද රු.841,460 ක විශ්‍රාම වැටුප් මාස 02 ත් 09 ත් අතර කාලයක් තැන්පතු ගිණුමේ රඳවාගෙන ප්‍රේෂණය කර තිබුණි. | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගේ 2011 ජුනි 14 දිනැති අංක 2/2011 දරන චක්‍රලේඛය පරිදි නොගෙවන ලද විශ්‍රාම වැටුප් මාසයක කාල සීමාවක් දක්වා නැවත ඉල්ලීම් කරනු ලැබුව හොත් ගෙවීම සඳහා රඳවාගත හැකි අතර, ඉන් පසුව එම නොගෙවූ විශ්‍රාම වැටුප් මුදල් නැවත ප්‍රේෂණය කළ යුතුය. | මේ වන විට පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇති මුදල් ප්‍රේෂණය කර ඇත. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ 2019 ජනවාරි 23 දිනැති ලිපියේ උපදෙස් පරිදි සෘජුවම බැංකු මගින් ප්‍රේෂණය කරනු ලැබේ. |

(ඇ) කාන්තා කාර්යංශය
----------------------

| | | | |
|---|---|---|---|
| i. | චක්‍රියණය වැඩසටහන යටතේ ණය ලබාගත් ප්‍රතිලාභීන්ගෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 7 ක 2018 ජුනි30 දින වන විට රු.108,120 ක ණය ශේෂයක් අයවීමට තිබුණි. | අරමුදලේ කොන්දේසි ප්‍රකාරව ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නීති මගින් කටයුතු කිරීමටඅවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවති. |
| ii. | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශ අධ්‍යක්ෂකගේ 2017 ජනවාරි 12 දිනැති අංක MWGA/WB/ග්‍රා.කා.සැ/2017 ලිපිය ප්‍රකාරව ප්‍රාදේශිය ලේකම් කාර්යාල 4 ක ග්‍රාම නිලධාරී වසම් 311 ககාන්තා කාර්ය සමාජ 48 ක් ලියාපදිංචි කර නොතිබුණි. | සෑම ග්‍රාම නිලධාරි වසමකටම කාන්තා කාර්ය සමාජ පිහිටුවා ලියාපදිංචි කළ යුතුය. | ලියාපදිංචි කිරිමට කටයුතු කරනු ලැබේ. |

(ඇ) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය
--------------------------------------

| | | | |
|---|---|---|---|
| i. | 2018 වර්ෂයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02 ක අඩුබර දරුවන් වෙනුවෙන්රු.1,315,320 ක වියදමක් දරා තිබුණද අඩුබර පෝෂණ මට්ටමක් සහිත පෙර පාසල් දරුවන් තෝරාගත් පදනම විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අඩු පෝෂණ මට්ටමක් සහිත දරුවන් හඳුනා ගැනීම ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල සහයෝගයෙන් සිදු කළ යුතුය. | 2019 වර්ෂයේ සිට ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වාර්තා ලබා ගන්නා බවත්, පවුල් සෞඛ්‍ය නිලධාරී හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ නිර්දේශ ලබාගෙනම අඩු බර දරුවන්ට මෙම ආහාර වේල ලබා දීමට කටයුතු යොදා ඇත. |
| ii. | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 08 ක ක්‍රියාත්මක පෙර පාසල් දරුවන් සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක - 1/2017 හා 2017 ජනවාරි 20 දිනැති | ප්‍රාදේශිය මහජන සෞඛ්‍ය පරික්ෂක විසින් නිරන්තරයෙන් පරික්ෂා කර ප්‍රාදේශිය ලේකම් වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතුය. | මහජන සෞඛ්‍ය පරික්ෂක පරීක්ෂා කලද ලිඛිතව ලබාගෙන නොමැත.ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි විසින් පරික්ෂා කරන බව දන්වා ඇතත් වාර්තා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | චක්‍රලේඛය අනුව උදෑසන ආහාරවේල ලබාදීමේ වැඩසටහන යටතේ, මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් උදෑසන ආහාර වේල පරීක්ෂා කළ යුතු වුවත්, නියමිත දිනට නියමිත වේලාවට නිර්දේශිත ආහාරවේල ලබා දුන් බවට ද, ලිඛිත සාක්ෂි නොතිබුණි. | | |
| iii. | පෙර පාසල් 05 ක අඩු බර සහිත ප්‍රතිලාභී දරුවන්ට අමතරව ළමුන් සංඛ්‍යාව 78 බැගින් ඉහළ නැංවීමට දන්වා තිබුණද, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජූලි මස වන විට ප්‍රතිලාභී දරුවන්ගේ සංඛ්‍යාව 184 සිට 172 දක්වා අඩුවී තිබුණි. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක අඩුබර දරුවන් 276 ක් සඳහා තවදුරටත් ප්‍රතිලාභ ලබාදීමේ හැකියාව තිබියදී ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි. | රජය විසින් අදාළ වැඩසටහන වෙනුවෙන් අමතර ප්‍රතිපාදන ලබාදීමට එකඟතාවය පළකර තිබුණ බැවින්ප්‍රතිලාභ අවශ්‍ය දරුවන් හඳුනාගෙන එම ප්‍රතිලාභය ලබාදීමට කටයුතු කළ යුතුය. | 2018 අගෝස්තු මස ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට ළමුන් 78 බැගින් වැඩි කර ගැනීමට දැනුම් දුන්න ද අවසාන මාස 03 බැවින් ඇතැම් කොට්ඨාශ තුළ පෙර පාසල් ගුරුවරුන් හා දෙමාපියන් වර්ෂ අවසානයේ මෙම වැඩසටහන ආරම්භ කිරීමට අකමැති වී ඇත. |
| iv. | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 08 ක 2018 දෙසැම්බර් 31 දින වන විට පෝෂණ මල්ල ලබා නොගත් අවස්ථා ගණන 3010 ක් වූ අතර ඒ වෙනුවෙන් ප්‍රතිපාදිත මුළු වියදම රු. 6,020,000 ක් විය. | චක්‍රලේඛය ප්‍රකාරව හැකි සෑම අවස්ථාවකදීම මව්වරුන් දැනුවත් කර ප්‍රතිලාභය ලබා දීමට කටයුතු කළ යුතුවේ. | මවට වවුචරය ලබා දෙන අවස්ථාවලදී, දැනුවත් කිරීම් සිදු කරන අවස්ථාවලදී හා දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම මගින් මව දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |
| (ඉ) | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | | |
| i. | 2017 හා 2018 වර්ෂවල සිදු වූ ස්වභාවික විපත් නිසා හානියට පත් වූ පුද්ගලයින්ට වන්දි ලබාදීම් වෙනුවෙන් මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 2018 වර්ෂයේදී රු.5,300,000 ක මුදලක් නිදහස් කර තිබුණද, අදාළ වැඩ කොටස් නිමකර නොතිබීම හා අනුමත මුදල ප්‍රමාණවත් නොවීම මත දෙසැම්බර් 31 දිනට ඉතිරි ප්‍රතිපාදන වූ රු.1,200,000 ක මුදලක් නැවත දිස්ත්‍රික් ලේකම් වෙත ප්‍රේෂණය කර තිබුණි. | ආපදා අවම වීම සඳහා හානියට පත්වූවන් වෙනුවෙන් කඩිනමින් මුදල් ගෙවීම් කළ යුතුය. | අධි හා මධ්‍ය අවධානම් පවුල් ලෙස 120 ක් හඳුනාගෙන ඇතත් මූලික වටයේ පවුල් 07 ක් පමණක් වන්දි ගෙවීමට අනුමත වී ඇති බවත් ඉතිරි පවුල් නැවත පදිංචි කිරීමේ කටයුතු චක්‍රලේඛ උපදෙස්වලට අනුව ආරම්භ කර ඇත. |
| ii. | 2016 ,2017 හා 2018 යන වර්ෂවල ආපදා තත්ත්වයන් හේතුවෙන් හානියට පත් වූ නිවාස වෙනුවෙන් | ආපදා අවම වීම සඳහා හානියට පත්වූවන් වෙනුවෙන් කඩිනමින් මුදල් ගෙවීම් කළ යුතුය. | මූල්‍ය ප්‍රතිලාභ ලබා දීම සිදු කරන්නේ ජාතික රක්ෂණභාර අරමුදලෙන් වන බවත් අදාළ ආයතන වෙත සිහි |

| | | | |
|---|---|---|---|
| | පන්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට රු.1,210,446 ක ප්‍රතිපාදන ජාතික රක්ෂණ භාර අරමුදලින් ඉල්ලුම් කර තිබුණ ද රු.69,890 ක මුදලක් පමණක් 2019 අප්‍රේල් 30 දින වන විට ලැබී ගෙවා තිබුණි. | | කැඳවීම් යවා අරමුදල් ලද විගස ගෙවීම් කරමි. |
| iii. | පන්විල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ 2014සිට 2018 වර්ෂය අතර කාලපරිච්ඡේදය තුළ ආපදා හේතුවෙන් නැවත පදිංචි කිරීමට වසම් 05 ක පවුල් 06 ක් හඳුනාගෙන ඇති අතර 2019 පෙබරවාරි 28 දින වන විටත් අදාළ පුද්ගලයින් විසින් පදිංචියට සුදුසු ඉඩමක් පිළිබඳ තොරතුරු ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ලබා දී නොතිබුණි. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නැවත පදිංචි කරවීම සඳහා සුදුසු ඉඩම් කොටස් රජය සතුව නොමැති බැවින්මේ වන විට අත්පත් කර ගැනීම සඳහා ද ඉඩම් හඳුනා ගනිමින් පවතී. සුදුසු ඉඩමක් ලද විගස පුද්ගලයින් පදිංචි කරවීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ. |
| iv. | පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පුස්සළු ඔය පිටාර ගැලීමේ ව්‍යාපෘතිය සඳහා,<br>(a) ප්‍රසම්පාදන කමිටුවේකොන්ත්‍රාත්විෂයපිළිබ ඳදැනුමක්ඇතිනිලධාරියෙකුසා මාජිකත්වයදරානොතිබුඅතරප්‍ර සම්පාදනඅස්ථිත්වයටපරිබාහිර පුද්ගලයෙකුද පත්කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.7. (අ), (ඇ) සහ (ඈ) වගන්ති අනුව ක්‍රියා කළ යුතු අතර, ඉංජිනේරු උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ඔහුගේ මුදල් පාලනය සම්බන්ධ කාර්ය පවරා දීම මත පත් කර ඇත. තාක්ෂණික කටයුතු පිළිබඳ දැනුම ඇති අයෙකු මේ සඳහා සහභාගි කරනු නොලැබුවේ මහවැලි අධිකාරියේ උපදේශකත්වය මත ඇස්තමේන්තුව සකස් කර තිබීම නිසාය. |
| | (b) ඔයෙන්ඉවත්කරනලදරොන්මඩ , අඩි 100 ක්දක්වාඉවතටප්‍රවාහනයකරඑම රොන්මඩඅතුරාතැලීම්කළයුතුවු වදඔයෙන්භාරනලදරොන්මඩඔ යදෙපසඉවුරුවලටදමාතිබුණි. | | නිසි අයුරින් මෙම රොන්මඩ ඉවත් කර ඉවුර ශක්තිමත් වන ආකාරයට හා ගංවතුර පාලනය වන ආකාරයට තැන්පත් කර තිබෙන බව නිරීක්ෂණය වේ. |
| v. | යටිනුවර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ නානුඔය ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොතිබුණි. තවදඑකතුකළ අගය මත බදුවලින් කොන්ත්‍රාත්කරු | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය සහ 4.2.2 මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කළ යුතු අතර, බදු වලින් නිදහස් කර ඇතිබව සනාථ කළ යුතු වේ. | මෙය ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් ඉටුකරන ලද්දකි. එම නිසා දිස්ත්‍රික් ලේකම් සැලැස්මට ඇතුළත් කර නොමැත. නමුත් විගණනයෙන් පෙන්වා දුන් පසු වර්තමානයේදී කාල සටහනක් පිළියෙල කරුනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | නිදහස් බවට තහවුරුවක් ද ලබාගෙන නොතිබූ අතර, රු.657,438 කින් අධි ඇස්තමේන්තුවක් ද සකස් කර තිබුණි. | එසේමශක්‍යතා අධ්‍යනයකින් පසු නිවැරදිව ඇස්තමේන්තු සැකසිය යුතුය. | ලංසු ඉල්ලුම් පත්‍රයේ වැට් අංකය විමසා ඇති අතර, එහි සඳහන් කර නොතිබීමෙන් ලියාපදිංචි වී නොමැති බව නිගමනය කරන ලදි. ඉදිරියට මෙම අඩුපාඩුව නිවැරදි කර ගනිමි. ඇළ මාර්ගයට බොහෝ ස්ථානවලින් පිවිසීමට නොහැකි පරිදි ගස් වැවී ඇති බැවින් යන්ත්‍ර සූත්‍ර රැගෙන ඒම පිළිබඳව ගැටළු පැන නැගුණි. ඒ අනුව ඇළ මාර්ගයෙන් මෙම යන්ත්‍ර ප්‍රවාහනය කිරීම සඳහා මඩ ඉවත් කළ යුතු විය. එබැවින් ඉහළ රේටයන් යොදාගත්ත ද මෙය ඇස්තමේන්තුවකි. |
| vi. | නාය යාම් අධි අවධානම් කලාපවල ජීවත්වන පවුල්වලට ස්ථිර නිවාස ඉදිකරදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් දොළුව හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දුන්එකතුව රු.50,000,000 ක ප්‍රතිපාදිත මුදල් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉඩම්වල යෝග්‍යතාවය සම්බන්ධයෙන් පරස්පර නිර්දේශයන් ඉදිරිපත් කිරීමත්, යෝග්‍ය නිවාස සැලැසුම් කඩිනමින් ලබා නොදීමත්, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිපාදන ලැබෙන තෙක් නැවත පදිංචි කරවීම සඳහා වන පූර්ව ක්‍රියාකාරකම් කිසිවක් සිදු කර නොතිබීමත් හේතුවෙන් අදාළ කාර්යයට මුදල් යෙදවීමකින් තොරව සම්පූර්ණ මුදලම මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරා දී තිබුණි. | කිසියම් ව්‍යාපෘතියක් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර ඇත්නම් එම ව්‍යාපෘතියෙන් අරමුණු ඉටු කර ගැනීම සඳහා කාර්යක්ෂම හා සැලැසුම් සහගත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය. | දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විගණන හා කළමනාකරණ කමිටුවේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මුළු ඉඩම්වල යෝග්‍යතාවය ප්‍රකාශකර පසුව ඉඩම් කට්ටි කළ පසු යෝග්‍ය නොවන බව ප්‍රකාශ කිරීම හේතුවෙන් මුදල් ආපසු යවන ලද බව ප්‍රකාශ කරන ලදී. |
| vii. | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2016 වර්ෂයේ ඇති වූ නායයෑම් තත්ත්වයන් හේතුවෙන් අධි අවධානම් කලාප ලෙස හඳුනාගත් බෙරවිල ප්‍රදේශයේ පවුල් 162 ක් පදිංචි කරවීම සඳහා කුරුඳුවත්ත | අධිඅවධානම් කලාපවල ජීවත්වන පිරිස් සඳහා ලබා දුන් ප්‍රතිපාදන ඉතා කඩිනමින් උපයෝජනය කර නැවත පදිංචි කිරීම කළ යුතු වේ. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මුලින් ලබා දුන් එකඟතාවය මත ගෙවීම් සිදු කළ ද පසුව එකඟතාවය ලබා නොදීම |

| | | | |
|---|---|---|---|
| | නගරයට ආසන්න අක්කර 25 ක පෞද්ගලික ඉඩමක් වෙන්කර ගෙන,එම ඉඩමේ නැවත පදිංචි කරවීම සඳහා පවුල් 153 කට ඉඩම් ලබාදී නිවාස ඉදිකර ගැනීමට 2018 නොවැම්බර් 16 දින පළමු වාරිකය ලෙස රු.30,600,000 ක් ගෙවා තිබුණි. 2019 අප්‍රේල් 08 දින වන විට ඉන් පවුල් 125 ක් කිසිදු ඉදිකිරීමක් නොකර අධි අවදානම් කලාපවලම ජීවත් වෙමින් පැවතුණි. | | හේතුවෙන් විකල්ප යෝජනාවලට අනුව නැවත පදිංචි කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව ප්‍රකාශ කරන ලදි. |
| viii. | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ නායයාමේ අධි අවදානම් හේතුවෙන් නැවත පදිංචි කළ යුතු බවට නිවාස 243 ක් හා වතු නිවාස 36 ක් හඳුනාගෙන තිබුණ ද පවුල් 135 ක් පමණක් නැවත පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇතත්, අධි අවදානම් ප්‍රදේශයේම දැනටමත් පදිංචි ඉතිරි පවුල් 126 ඉවත් කර, නැවත පදිංචි කරවීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. මෙම ඉඩමේ මාර්ග සංවර්ධනය කිරීම වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.1,929,960 ක වියදමක් දරා ක්‍රමානුකූල සැලැස්මකින් තොරව අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉදිකර තිබුණි. | අධිඅවදානම් කලාපවල ජීවත්වන පිරිස් සඳහා ලබා දුන් ප්‍රතිපාදන ඉතා කඩිනමින් උපයෝජනය කර නැවත පදිංචි කිරීම කළ යුතු වේ. | -එම- |

(උ) වැඩිහිටි මහ ලේකම් කාර්යාලය
---------------------------------------

| | | |
|---|---|---|
| වැඩිහිටි දීමනා මාස 03 ක් අඛණ්ඩව ලබා නොගත් බව ලේඛනය අනුව තහවුරු වීමෙන් පසු උඩුනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේවිෂය ලිපිකරු විසින් කමිටුඅනුමැතිය ලබා ගැනීමෙන් තොරව දීමනා ලාභීයා ඉවත් කර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශිය කමිටු මගින් තීරණය කොට අදාළ දිමනාලාභියාගේ නම දිමනා ගෙවීම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුයි. | ග්‍රාම නිලධාරි වාර්තාව අනුව නාම ලේඛනයෙන් ඉවත් කර පසුව කමිටු අනුමැතිය සඳහා යොමු කර ඇත. |

(ඌ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
---------------------------------------------

| | | |
|---|---|---|
| කුසලතා සංවර්ධන, කාන්තාවන් බලගැන්වීම, ග්‍රාමීය සංවර්ධන හා සියළුම දිස්ත්‍රික්කවල කාන්තාවන් 4000 කගේ ජීවන තත්ත්වය උසස් කිරීම හා රැකියා දස ලක්ෂයක් බිහිකිරීමේ රජයේ වැඩපිළිවල | | |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| i. | අමාත්‍යාංශය මගින් නම් කර ඇති පුහුණුලාභීන් 160 ක් යෝජිත කර්මාන්ත ශාලා 08 ක මාස 06 ක පුහුණුවකට යොමුකර තිබුණි. එම ආයතන හවුල් ව්‍යාපාර හෝ සමූපකාර සමිති වශයෙන් ලියාපදිංචි කර පවත්වාගෙන යායුතු වුවද, එක් ආයතනයක් හෝ එසේ ලියාපදිංචි කර නොතිබූ අතර, කර්මාන්ත ශාලා 05 ක මෙහෙයුම් කාර්යයන් සම්පූර්ණයෙන් නතර කර වසා දමා තිබුණි. | වැඩසටහනින්බලාපොරොත්තුවන අරමුණ සඵලකර ගැනීමට කටයුතු කළයුතු වේ. | අවශ්‍ය වැඩ පිළිවෙලක් සකසමින් පවතින බවත් එහි ප්‍රගතිය ත්‍රෛමාසිකව අධීක්ෂණය කිරීමට කටයුතු යොදා ඇති බවත් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පවසා ඇත. |
| ii. | මෙම කර්මාන්ත ශාලා 08 සඳහා රු.9,781,156 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ අයිතමයන් 14 බැගින් සැපයුම් කර තිබුණි. | රාජ්‍ය මුදල් වැයකර මිළදීගත් භාණ්ඩ වගකිවයුතු පිරිසක් වෙත ලබාදීමට කටයුතු කළ යුතුවේ. | උපකරණ භාරදීමට නිසි උපදෙස් දී ඇතත් අමාත්‍යාංශය විසින් එය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| iii. | කර්මාන්ත ශාලා 06 ක රු.2,998,344 ක් වටිනා වත්කම් ඌනතාවයක් අනාවරණය වූ අතර,වටගොඩකර්මාන්ත ශාලාවටලබාදීතිබුරු.1,187,592 ක්හා යටිවාවල කර්මාන්තශාලාව සඳහා සැපයුම් කර ඇති රු.572,925 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ පාසලක හා විහාරස්ථානයක අනාරක්ෂිතව රැස්කර තිබුණි. | වත්කම් ඌනතාවයට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නීතිමය ක්‍රියාමාර්ග ගැනීමත්, වත්කම් නිසි පරිදි රජයට පවරාගෙන වෙනත් අවශ්‍යතාවයන් ඇති පාර්ශවයන් වෙත මුදාහැරීමක් කළ යුතුය. | වටගොඩ හා යටිවාවල - ගල්හින්න ඇගළුම් කර්මාන්තවලට අදාළ භාණ්ඩ මාවිල්මඩ පිහිටි අමාත්‍යාංශ සම්බන්ධීකරණ ලේකම්ගේ නිවසේ ඇත. |
| iv. | නීතිමය ක්‍රියාමාර්ග තුළින් නැවත ඒවා ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ප්‍රාදේශිය ලේකම්වරුන්ට බලය පවරා ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබීමෙන් වත්කම් අවභාවිතා වී තිබුණි. | රාජ්‍ය මුදල් වැයකර ලබාගත් භාණ්ඩ අවභාවිතා නොවිය යුතුය. | අවභාවිතයක් සිදුව නොමැති බව දන්වා ඇත. |

(එ) ක්‍රීඩා අමාත්‍යාංශය
----------------------

| | | | |
|---|---|---|---|
| i. | හතරලියද්ද මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩාපිටිය පුළුල් කිරීමේ ඇස්තමේන්තුවට අනුව පුපුරවන ලද ගල්, බැකෝ යන්ත්‍රයක් මගින් ඉවත් කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණද ගල් පුපුරවා නොහැර මතුපිට පස් ඉවත් කිරීම වෙනුවෙන් බැකෝ යන්ත්‍රයට රු.100,800 ක් ගෙවා තිබුණි. | වැඩ විෂයන් හඳුනාගෙන නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | ඇස්තමේන්තු සංශෝධනය කර ගෙවීම් කිරීමට කටයුතු කරමි. |
| ii. | රු.1,000,000 ක ප්‍රතිපාදන මත ඉඩමේගම ප්‍රධාන මාර්ගයේ සිට විද්‍යාල භූමිය මැදින් දිවෙන මාර්ගයේ අතරමැදි වූ කොටසෙහි ක්‍රීඩාපිටියට ආධාරක බැම්මක් මීටර් 4.2 ක් උසට ඉදිකර තිබුණ ද එහි මුදුනත ක්‍රීඩාපිටියට සම මට්ටම්වන සේ පස් නොපිරවීම හා දෙකෙළවර විවෘතව පැවතීම බැම්මට හානිදායක වූ බැවින් අරමුණු සඵලවී නොතිබුණි. | කිසියම් අරමුණක් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීමේ දි අරමුණ ඉටුකර ගතහැකි වන පරිදි එම මුදල් උපයෝජනය කළ යුතු වේ. | ඉදිරියේදී දන්වා ඇති අඩුපාඩු සම්පූර්ණ කරමි. |
| iii. | නුගවෙල මධ්‍යමහා විද්‍යාලයේ ගෘහස්ථක්‍රීඩාගාරයඉදිකිරීමවෙනුවෙන් 2014 වර්ෂයේසිට 2017 වර්ෂයදක්වාරු.23,847,779 කමුදලක්වැයකර විදුහල වෙත එය භාරදී තිබියදී 2018 වර්ෂයේ එහි වැඩ අවසන් කිරීම සඳහා රු.10,000,000ක ප්‍රතිපාදන සලසා දී තිබුණි.එම මුදලින් පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.7,102,358 ක් වැය කර තිබුණි. තවද මෙම ගෘහස්ත ක්‍රීඩාගාරය ඉදිකිරීම වෙනුවෙන් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් නොකර මේ වන විට රු.30,950,137 ක වියදමක් දරා තිබුණද එය නිසිඵලදායීතාවයක් නොවූ නොනිමි ව්‍යාපෘතියක්විය. | අනුමත සැලැස්මකට ප්‍රතිපාදන ලබා දියයුතු අතර, ප්‍රතිපාදන අපේක්ෂිත අරමුණ ළඟා කර ගැනීමට හැකිවන අයුරු යොදා ගත යුතුවේ. | වරින් වර ලබා දුන් ප්‍රතිපාදන මත ඇස්තමේන්තුවලට අදාළ වැඩ කොටස් නිම කර විදුහල්පතිවරයා වෙත භාර දෙන ලදි. |
| iv. | ක්‍රීඩා අමාත්‍යාංශය විසින් අකුරණ අස්හර් මධ්‍ය මහා විද්‍යාලීය දැල්පන්දු ක්‍රීඩාගාරය ඉදිකිරීමට හා ක්‍රිකට් තණනිල්ල (පිච්එක) සංවර්ධනය කිරීම සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන වෙන් කරදී තිබුණි. අදාළ | වෙන් කර ගත් ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කළ යුතු වේ. | 2018 අප්‍රේල් 27 අස්හර් මහ විද්‍යාලයේ ව්‍යාපෘතිය අනුමත වී ඇත. ඇස්තමේන්තු සකස් කිරීම සඳහා පළාත් අධ්‍යාපන ඉංජිනේරු වෙත ඉදිරිපත් කර ඇතත් මාස 03 ක් ගතවී ඇස්තමේන්තු සකස් නොකිරීම මත |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තු සකස් කර නියමිත දින අමාත්‍යාංශය වෙත යොමු නොකිරීම නිසා 2018 ජුනි 13 දිනැති ලිපියෙන් අදාළ ප්‍රතිපාදන අවලංගු කර තිබුණි. | | ව්‍යාපෘතිය අවලංගු වී ඇත. මෙම යෝජනා සියල්ල හඳුනා ගැනීම සහ තෝරා ගැනීම ක්‍රීඩා අමාත්‍යාංශයෙන් සිදු කරනු ලැබේ. |
| (ඒ) | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br>------------------------------------------- | | |
| i. | උඩුදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දේවින්නේගම නළ ජල ව්‍යාපෘතිය සඳහා ලැබූ රු.1,438,265 ක මුදල ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත 2017 දෙසැම්බර් 31 දින ගෙවීම් කර තිබුණ ද ජල ධාරිතා පරීක්ෂණයට අනුව ජල ධාරිතාවය ප්‍රමාණවත් නොවන බවට තීරණය වීමෙන් එම ස්ථානයේ නළ ළිඳක් පමණක් සවි කිරීමටත් ඉතිරි ප්‍රතිපාදන බඹරබැද්ද ජල ව්‍යාපෘතියේඉතිරි වැඩ නිම කිරීමටත් යොදා ගැනීමට තීරණය කර තිබුණි. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රථම නිසි අධ්‍යනයකින් පසුව ප්‍රතිපාදන ලබා ගත යුතු වේ. | ඇස්තමේන්තුව අනුව පොම්පාගාරයක් සවිකළ යුතුව ඇතත් ජල ධාරිතාවය ප්‍රමාණවත් නොවන බැවින් නල ළිඳක් සවිකිරීමටත් ව්‍යාපෘතියේ ඉතිරි ප්‍රතිපාදන බඹරබැද්ද ජල ව්‍යාපෘතියට යොදා ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය වෙත දැනුම්දී ඇත.<br>. |
| ii. | දිස්ත්‍රික් විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා රියදුරු පුහුණුව ලබාදීම වෙනුවෙන් ප්‍රතිලාභීන් 76 දෙනෙකුට රු.922,000 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද ප්‍රතිලාභීන් 25 දෙනෙකු සුදුසුකම් සපුරා නොතිබීම හා ඉදිරිපත් නොවීම හේතුවෙන් රියදුරු පුහුණුව ලබාගෙන නොතිබුණි. | වෙනත් අමාත්‍යාංශයකින් ප්‍රතිපාදන ලැබීමේදී සැලැසුම් කළ පරිදි ව්‍යාපෘති සියල්ල නිම කළ යුතුය. | සෑම ප්‍රාදේශිය විගණන කළමනාකරණ කමිටුවේදීම පසු විපරම් සිදු කරන ලෙසත් ප්‍රගතිය සාකච්ඡා කිරීමටත් තීරණය කරන ලදි. |
| iii. | යටිතල පහසුකම් සංවර්ධන විශේෂ වැඩසටහන යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 01 ක ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් රු.800,000 ක වියදමක් ද ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය වැඩසටහන යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 01 ක ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් රු.970,000 ක වියදමක් ද විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ උඩුනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ එක් ව්‍යාපෘතියක් වෙනුවෙන් රු.999,020 ක් ද දරා තිබුණත් එම ප්‍රතිපාදනවලින් | වියදම් කරන ලද මුදලින් අරමුණු හා ප්‍රතිලාභ ලැබිය යුතුය. | විහාරාධිපති හිමිවරුන්ගේ හා දායක සභාව විසින් පවරන සියළු අයිතමයන් සඳහා ඇස්තමේන්තු සැකසීමට විශාල පිරිවැයක් වැය වන හෙයින් මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් නොකළ බවත්, ව්‍යාපෘතිවල ඉතිරි වැඩකොටස් වෙනත් මාර්ගවලින් ප්‍රතිපාදන සලසා ගෙන දැනටමත් නිම කරමින් පවතින බවත්, විහාරාධිපති හිමිවරුන් ප්‍රකාශ කරන ලදි. |

| | | | |
|---|---|---|---|
| | සීමිත කොටස් කීහිපයක් පමණක් ඉටු කර තිබුණි. | | |
| iv. | ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක රු.7,570,387ක වියදමක් දරා නිමකරන ලද ව්‍යාපෘති 10 ක් ද යටිතල පහසුකම් සංවර්ධන විශේෂ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක රු.5,085,861 ක වියදමක් දරා නිමකරන ලද ව්‍යාපෘති 08 ක් ද සම්බන්ධව සිදු කළ භෞතික පරික්ෂාවේදී ව්‍යාපෘති 02 පෞද්ගලික නිවසකට පිවිසෙන මාර්ගයන් බවද ව්‍යාපෘති 04 ක් අනුමත ඇස්තමේන්තුවට අනුකූල නොවීම් ද, ව්‍යාපෘති 07 ක් ඉදිකිරීම් ප්‍රමිතියට අනුකූල නොවීම් ද, ව්‍යාපෘති 04 ක්ඇස්තමේන්තු නිවැරදි නොවීම් ද, ව්‍යාපෘති 01 ක් ඉදිකිරීම් අසම්පූර්ණ වීම්ද නිරීක්ෂණය විය. | ප්‍රතිලාභ වැඩි පිරිසකට අත්වන සේ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර ඉදිකිරීම්, ගිවිසුම් කොන්දේසීවලට, අනුමත ඇස්තමේන්තුවලට හා නිසි ප්‍රමිතියට ද අනුකූල විය යුතු වේ. | පෞද්ගලික පාරක් ලෙස දක්වා ඇති ව්‍යාපෘති 02 සඳහා ප්‍රාදේශීය සභාවලින් එකඟතාවය ලබා දී ඇති බවත්, අධික වර්ෂාව හා මාර්ගයේ පිහිටීම හේතුවෙන් ව්‍යාපෘති ඇස්තමේන්තුවලට අනුකූල නොවූ බවත් ප්‍රමිතියට අනුකූල නොවූ ව්‍යාපෘති 07 මේ වන විට නැවත යථා තත්ත්වයට පත් කර ඇති බවත්, ඇස්තමේන්තු නිවැරදි නොවීමට හේතුව ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම මත අවශ්‍යම කොටස් ඉදිකිරීමත්, අසම්පූර්ණව ක්‍රීඩාංගණය ඉදිකිරීම මේ වන විට පස් ඉවත් කර සම්පූර්ණ කර ඇති බවත්, |
| (ඔ) | කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | | |
| | පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපෘති 26 ක් හා පුහුණු වැඩසටහන් 09 ක් සඳහා වෙන් කරන ලද රු.5,140,131 ක ප්‍රතිපාදනයෙන් වර්ෂය තුළ පුහුණු වැඩසටහන් 05 ක් හා ව්‍යාපෘති 05 ක් පමණක් ඉටු කර තිබූ අතර, වැය වූ මුදල රු.1,362,317 ක් වූ අතර, එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 27 ක් විය. | වෙන් කරන ලද ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් යොදා ගත යුතු වේ. | ව්‍යාපෘති 26 ක් හා පුහුණු වැඩසටහන් 9 කින් මෙම ව්‍යාපෘති 35 සමන්විත වන අතර, ව්‍යාපෘති සකස් කරන ලද නිලධාරීන් ස්ථාන මාරු වීම හා දේශපාලන වෙනස්වීම් මත ප්‍රතිපාදන පවරන ලෙස දැනුම් දීම නිසා මෙය සිදුව ඇත. |
| (ක) | ජනාධිපති ලේකම් කාර්යාලය | | |
| | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ප්රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක පිහිටුවා ඇති සීමා සහිත ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර 19 ක් වෙනුවෙන් රු.18,807,800 ක මුදලක් සමිති ගිණුම්වලට බැර කර තිබුණ ද වර්ෂයේ රු.3,800,000 ක | ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනිම සඳහා ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයවලට නිසි පරිදි උපදෙස් ලබා දිය යුතුවේ. | මෙම වැඩසටහන සම්බන්ධයෙන් නිශ්චිත චක්‍රලේඛ නිකුත් වී ඇත්තේ 2019 දීය. එබැවින් 2018 වර්ෂයේදී මේ සඳහා ප්‍රශස්ථ මුදල් උපයෝජනයක් කළ නොහැක. |

උපරිමයකට යටත්ව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 19 ක් පමණක් ඉටු කර තිබුණි.

2.3 තැන්පත් ශේෂයන්

තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02 ක වැඩ අවසන් කර නඩත්තු කාලය ද අවසන් ව්‍යාපෘති 39ක් සම්බන්ධයෙන් තාක්ෂණික නිලධාරී වාර්තාවන් ලබා ගෙන නිරවුල් කිරීමට කටයුතු නොකර රු.1,452,939ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | ව්‍යාපෘති මුදල්වලින් අතරුඳවුම් මුදල් ලෙස රඳවා ගන්නා ලද මුදල් නඩත්තු කාලය අවසානයේ කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ වර්තමාන තත්ත්වය පිළිබඳ තාක්ෂණික නිලධාරී වාර්තාවක් ලබාගෙන නිරවුල් කළ යුතුය. | උඩුදුම්බර ව්‍යාපෘති 35 ක හා මැදදුම්බර ව්‍යාපෘති 04 හි මේ වන විට කොන්ත්‍රාත්කරු දැනුවත් කර තාක්ෂණ නිලධාරී වාර්තා ලබා ගැනීමට හා ප්‍රාදේශිය සභා විමසා නිරවුල් කිරීමට කටයුතු කරමින් පවති. |
| (ආ) | පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත 2018 ඔක්තෝබර් 25 දින හින්දු කෝවිලක් සංවර්ධනය කිරීම සඳහා ලබාදුන් රු.90,000 ක මුදල 2019 පෙබරවාරි 08 දින වන විටත් ක්‍රියාත්මක නොකර පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | තැන්පත් ගිණුමේ මුදල් දීර්ඝ කාලයක් රඳවාතබා ගැනීමකින් තොරව අදාළ ව්‍යාපෘති ඉටු කල යුතුය. | සිදු කරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදී කොවිල් කමිටුව විසින් එම මුදල අළුතින් ඉදිකිරීමට යෝජිත නව කෝවිලක් වෙත ලබා දෙන ලෙස ඉල්ලා ඇත. එහෙත් සංස්කෘතික දෙපාර්තමේන්තුව යෝජනාව වෙනස් කළ නොහැකි බව දන්වා ඇත. 2019 අවිච්ඡේද ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කරමින් පවති. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධනය සම්බන්ධයෙන් අනාවරණය වූ ඌනතාවයන් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2018 වර්ෂය සඳහා සකස් කළ ක්‍රියාකාරී සැලැස්මේ 2018 වර්ෂයේ අයවැයට අනුකූල ලෙස ඉටුකළ යුතු | චක්‍රලේඛයට අනුව පිළියෙල කළ යුතුය. | 2018 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේදී අයවැයට අනුකූල ලෙස ඉටු කළ යුතු සංවර්ධන වැඩසටහන් නිලධාරීන්ගේ |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන වැඩ සටහන් ඇතුළත් කර නොතිබුණි. | | විෂය පථය මට්ටමින් ඇතුළත් කර ඇත. 2019 අයවැය සකස් කිරීමේදී අංශ මට්ටමින් තොරතුරු ඇතුළත් කර ඇති බව දන්වමි. |
| (ආ) | ආයතනයේ සංවිධාන ව්‍යුහයට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. | මෙම තොරතුරු වෙනම වාර්තාවක් ලෙස සකස් කර තිබුණද ක්‍රියාත්මක සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. 2019 වර්ෂයේ මෙය ක්‍රියාත්මක සැලැස්මට ඇතුළත් කරන බව දන්වමි. |
| (ඇ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කරනු ලබන කාල රාමුව දක්වා නොතිබුණි. | චක්‍රලේඛයට අනුව පිළියෙල කළ යුතුය. | ක්‍රියාත්මක සැලැස්ම කාර්තු සටහන් අනුව කාල රාමුව දක්වා ඇත. |

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම
-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දෙසැම්බර් 12 ගිවිසුම් අත්සන් කරන ලද උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2018 මැයි වන විට අවස්ථා 3 කදී සංශෝධනය කර තිබීමෙන් මහල් දෙක වෙනුවට මහල් තුනක ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෝජනා වීමෙන් ඉදිකිරීම් භූමියේ පස් කපා ඉවත් කර පසුව පෙන්වා ඇති ස්ථානයේ කොන්ක්‍රීට් බැම්මක් ඉදිකිරීම නිසා ඇති වූ හිඩැස පස් දමා පුරවා තිබුණි. | ව්‍යාපෘතියක් ඉටු කිරීමේදී ඒ සඳහා විධිමත් අනුමත වාස්තු විද්‍යාත්මක සැලැසුම් හා ඇස්තමේන්තු අනුව කටයුතු කළ යුතුය. | දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස සැලැසුම් කර පසුව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා භූමියේ ස්වභාවය අනුව ගොඩනැගිල්ලට පිටුපස කොන්ක්‍රීට් රැඳවුම් බැම්මක් ඉදිකර ඒ මත සම්මන්ත්‍රණ ශාලාවක් ඉදිකිරීමට සැලැසුම් සංශෝධනය කරන ලද බවත් ඒ සඳහා පස් කණ්ඩිය කපා ඉවත් කළ යුතු බවත් බැම්ම ඉදිකිරීමෙන් අනතුරුව හිස් ඉඩ නැවත පිරවිය යුතු බව අනිවාර්ය වේ. |

3.3 ප්‍රසම්පාදනයන්

------------------

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මගින් රුපියල් මිලියන 97 ක් වෙනුවෙන් ලංසු කැඳවන ලද උඩුදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා අවම වශයෙන් CIDA/C4 අවම ලියාපදිංචිය ඉල්ලා තිබුණු අතර, සැලැසුම සංශෝධන වීම මත වැඩිවන වැඩ පිරිවැය ද එකතු කළ විට මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 134 ක් වී තිබුණි. මෙම මූල්‍ය සීමාව තුළ කටයුතු කිරීමට CIDA/C3 සුදුසුකම අවශ්‍ය වී තිබුණත් එම සුදුසුකම අදාළ කොන්ත්‍රාත්කාර ආයතනය වෙත නොතිබුණි. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයේ සඳහන් අරමුණු සාක්ෂාත්කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඇස්තමේන්තුව අදියර දෙකක් යටතේ ලබාදී ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර ගැනීමට සැලැසුම් නොකරන ලද හා ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොකරන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් මිලියන 4.2 ක් වැය කර තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතු අතර වෙනස් වීම් සිදු වන්නේ නම් ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කළ යුතුය. | කාර්යාල පරික්ෂාවේදී මෙම ඉදිකිරීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස හඳුනාගත් බැවිනුත්, ඉඩම් අංශය වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය බව තීරණය කළ බැවිනුත් එය සකස් කරන ලදි. |

3.4 වත්කම් කළමනාකරණය

-----------------------------

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වෙන්දේසි කළ ද ගැනුම්කරුවන් ඉදිරිපත් නොවීම නිසා රු.80,500 ක තක්සේරු වටිනාකමක් ඇති ඇඹිලි සලකුණු යන්ත්‍රයක්, අල්මාරි හා දොරවල් සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02 ක් විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අළෙවි නොවූ භාණ්ඩ සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරීන්ගේ උපදෙස් මත සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය | 2019 වර්ෂයේ ප්‍රතිපාදන නොමැතිවීම නිසා දෙල්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඇඟිලි සලකුණු යන්ත්‍රය අළුත්වැඩියා කර ගැනීමට නොහැකි විය. අනෙක් භාණ්ඩ සඳහා 2019 වර්ෂයේදී සුදුස්සක් කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමීක්ෂණ මණ්ඩලය විසින් අළුත්වැඩියා කර පරිහරණය සඳහා නිර්දේශ කර තිබූ භාණ්ඩ අයිතම 05 ක් නැවත පරිහරණය සඳහා යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩල තීරණ කාලප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කළ යුතුය. | ප්‍රතිපාදන ලැබුණු පසු එම අයිතමයන් අළුත්වැඩියා කර පරිහරණය කිරීමට බලාපොරොත්තු වේ. |

3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම
---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් 40 දෙනකු විසින් ඇප තැන්පත් ලබාදී නොතිබූ අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3කින් ස්ථාන මාරුවී පැමිණි ඇප තැබිය යුතු නිලධාරීන් 11 දෙනෙකුගේ බැංකු පාස්පොත් හා ඇප තැබීම් පිළිබඳ තොරතුරු අදාළ ආයතන වෙතින් ගෙන්වා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. එසේම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක සේවයේ නියුතුව සිට වෙනත් රජයේ ස්ථාන වෙත මාරු වී ගිය නිලධාරීන් 17 දෙනෙකුගේ බැංකු පාස් පොත් අදාළ ආයතන වෙත යවා නොතිබූ අතර, ඇප තබා ඇති තනතුරක් දැරීම අවසන් වූ (විශ්‍රාම ගිය) නිලධාරීන් 22 නෙකුගේ ඇප තැන්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල5 ක් විසින්නිදහස් කිරීම සිදුකර කර නොතිබුණි | 1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව හා මුදල් රෙගුලාසි 891 (4) හා 893 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | ඇප තැන්පත් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර, ඇප තැන්පත් සම්බන්ධ අනෙකුත් කරුණු නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

3.6 පාඩු හා හානි
----------------

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රථ වාහන හානි ලේඛනය අනුව රු. 42,528 ක් වටිනා වාහන අනතුරු තුනක් 2018 මූල්‍ය ප්‍රකාශනයේ "පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය -සටහන (i)"හි, ඇතුළත් කර නොතිබුණි | සියලුම රථ වාහන සිදුවූ හානි මූල්‍ය ප්‍රකාශනයේ "පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය - සටහන (i)" ට ඇතුළත් විය යුතුය. | ප්‍රමාද දෝෂයකින් ඇතුළත් වී නොමැත. 2019 මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කරනු ලැබේ. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනයේ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර ඇති | මූල්‍ය ප්‍රකාශනයේ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට ඇති | සටහන් කිරීමේදි ප්‍රමාද දෝෂයක් සිදු වී ඇත. |

| | | | |
|---|---|---|---|
| | රු.4,998,544 ක් වූහානි හා පාඩු 04 ක් අය වී ඇතත් මූල්‍ය ප්‍රකාශනවල මුළුමනින්ම අයවිය යුතු අලාභ ලෙස දක්වා තිබුණි. | හානි හා පාඩු පිළිබඳව තොරතුරු පමණක් ඇතුළත් කළ යුතුය. | |
| (ඇ) | අනතුරු 06 කට අදාළව එකතුව රු.382,209 ක් වූ පෙර වර්ෂවල අයකිරීම් හා කපා හැරීම් වර්ෂය තුළ සිදුකළ අයකිරීම්, කපා හැරීම් ලෙස දක්වා තිබුණි | වර්ෂයට අදාළ අයකිරීම් හා කපා හැරීම් පමණක් මූල්‍ය ප්‍රකාශනය තුළ දැක්විය යුතුය. | පෙර වර්ෂවලදී විසර්ජන ගිණුමට ඇතුළත් කර නොතිබුණු නිසා මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කපා හැරීම් ලෙස ඇතුළත් කර ඇත. |
| (ඈ) | උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක CPPD – 6103 වාහනයේ 2017 මැයි 05 දින සිදුවූ අනතුරට අදාළව මුළු පිරිවැය රු.2,223,927 ක් වූ අළුත්වැඩියාව සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්ගෙන් හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අනුමැතියක් ලබාගෙන නොතිබූ අතර මේ වනවිට ආවරණය නොවූ රු.210,093 ක අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අලුත් වැඩියාවට අදාල අනුමැතිය ලබා ගත යුතු අතර මුදල් රෙගුලාසි අවසන් වාර්තාවට අනුව ආවරණය නොවූ අලාභය අයකර ගත යුතුය. | මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ වාර්තාවට අනුව රජයට සිදු වී ඇති අලාභය අයකර ගැනීමට නීතිපති උපදෙස් පරිදි නඩු පැවරීමට කටයුතු කර ඇත. |
| (ඉ) | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 2008 නොවැම්බර් 18 වන දින අනතුරට පත් WPPA - 4984 අංක දරන වාහනය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් වැයවී තිබූ රු.288,348 ක වටිනාකම එවකට ප්‍රාදේශිය ලේකම්ව සිටි තැනැත්තියගෙන් අයකිරීමට නිර්දේශ ලබා දී තිබුණ ද නිලධාරිනිය විසින් සිදුකරන ලද අභියාචනා හේතුවෙන් අනතුර සිදුවී වසර 11 ක් ගතවී ඇතත් අලාභය අය කර ගෙන නොතිබුණි. | අලාභයට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම වාහන අනතුර සම්බන්ධයෙන් අවසන් තීරණ ලැබී නොතිබුණි.<br><br>විගණන කළමනාකරණ කමිටු රැස්වීමේ දී මෙම වාහන අනතුර සම්බන්ධයෙන් එකඟතාවයන් නොමැත.<br><br>විගණන කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් පත් කර ඇති කමිටුවේ වාර්තාවන් රැගෙන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට 2019 මැයි 30 දින පැමිණෙන ලෙස දන්වන ලදි. |
| (ඊ) | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් CPPD – 0900 අංක දරන රථය 2015 ජුනි11 දින අනතුරකට පත්ව තිබූ අතර, එහි | අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර අවසාන පරීක්ෂණ වාර්තාවේ අවශ්‍ය සංශෝධන සිදු කිරීම පිණිස මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව, |

| | |
|---|---|
| වියදම රු.3,402,652 ක් විය. රක්ෂණ සමාගමෙන් රු.2,972,486 ක මුදලක් ලැබී තිබුණ ද රක්ෂණ මුදලින් ආවරණය නොවූ රු.430,165 ක මුදල ආවරණය කරගත් ආකාරය තහවුරු නොවිය. | නිර්දේශ කරන ලද නව පරීක්ෂණ මණ්ඩලය වෙත අනුමැතිය ලබා ගැනීමට අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා ඇත. |

3.7 අනාර්ථික ගනුදෙනු

---------------------

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 කට අදාළව නිලධාරීන් 5 දෙනෙකු යතුරු පැදි ලබාගැනීමෙන් පසු යතුරුපැදි හිමි නොවන වෙනත් තනතුරුවලට මාරුවී ගොස් තිබුණද ඔවුන්ගෙන් යතුරු පැදියේ වෙළඳපොළ වටිනාකම වූ රු.688,500 ක මුදල ආපසු අයකරගෙන නොතිබුණි. | 2015 ජුලි 07 දිනැති ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අයවැය අධ්‍යක්ෂක ජනරාල්ගේ අංක BD/GPS/130/9/14/MC-ii දරන ලිපිය ප්‍රකාරව යතුරුපැදියේ වෙළඳපල වටිනාකම ආපසු ගෙවිය යුතු වේ. | උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් තිදෙනා කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන නිලධාරීන් වේ. වැටුප් ගෙවන්නේද එම අමාත්‍යාංශයෙනි. පාතදුම්බර නිලධාරිනිය මෙතෙක් ගෙවා නොමැති අතර, යටිනුවරනිලධාරිනියගේ පත්වීම අවලංගු කර ඇති බැවින් නීතිපති විමසා ඇත. |

3.8 කළමනාකරණ දුර්වලතා

-------------------------

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණපහත දැක්වේ.

| | විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නියැදි පරීක්ෂාවේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක අවස්ථා 53කදී ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන්, වර්ෂ 01 ත් 26 ත් අතර පරාසයක කාල ප්‍රමාදයක් පැවති අතර, ඒ හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමෙන් පසු බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව අත්පත් කර ගැනීම කඩිනමින් සිදුකළ යුතුවේ. | ඉඩම් අත්පත් කර ගැනීමේදී විවිධ පියවරයන් වෙනත් ආයතන මගින් ඉටු කර ගත යුතු බැවින්, ප්‍රමාදයක් සිදුවුවද හැකි ඉක්මනින් කටයුතු කිරීමට උත්සහ කරනු ලැබේ. |
| (ආ) | උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුස්සැල්ලාව නගර සීමාව තුළ පිහිටා ඇති ඉබ්බන්වැව නැමති ගමෙන් රජය වෙත පවරාගෙන තිබුණු ඉඩම්වලින් පර්චස් 32.66 ක ප්‍රමාණයක් | රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත් අනුව කටයුතු කළ යුතුය. | අනවසරකරුවන් භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය පර්චස් 14.4 කි. 1979 අංක 07 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) සංශෝධිත පනත |

| | | | |
|---|---|---|---|
| | පුද්ගලයින් 05 දෙනෙකු විසින් අනවසරයෙන් භුක්ති විඳිමින් සිටින නමුත් 1979 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ එම ඉඩම් සන්තකය ආපසු ගැනීමට කටයුතු කර නොතිබුණි. | | අනුව කටයුතු කිරීමේදී ආයතන ප්‍රධානියාට බලය පවරා ඇත. |
| (ඈ) | ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක ඒ/106/728 LDO0A/0568/ 2015 දරන රජය සතු ඉඩමේ මුල් අයිතිකරුගේ අභාවයෙන් පසු ඔහුගේ බිරිඳ හා දරුවන් ජීවතුන් අතර සිටියදී ව්‍යාජ දිවුරුම් ප්‍රකාශයක් පදනම් කරගෙන ඔහුගේ සහෝදරියකට පවරා ඉන් පසු තවත් පුද්ගලයෙකුට පවරා තිබීම, නිත්‍යානුකූල නොවන බවත්, ඒ අනුව මුල් උරුමයේ අයතිය පැවරීමේ වරද නිවැරදි කරන ලෙසට ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ලබාදී තිබූ උපදෙස් පිළිපැද නොතිබුණි. | මුල් උරුමය පැවරීමේ කටයුතු ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉටුකළයුතු අතර ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | ඉඩම් සංවර්ධන ආඥා පනතේ III වන උපලේඛනය අනුව මීළඟ උරුමකරුට උරුමය ලබාදී ඇත.ඉඩම් කොමසාරිස් වෙතින් අවසන්වරට 2019 අප්‍රේල් 08 දින විමසීම් කර ඇත. |
| (ඇ) | මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අධි අවදානම් ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) මගින් 2017/2018 වර්ෂවල නිර්දේශ කර ඇති අධි අවධානම් ප්‍රදේශවල ජීවත්වන පවුල් 120 දෙනාගෙන් පවුල් 07 ක් පමණක් නැවත පදිංචි කිරීම සඳහා කටයුතු කරගෙන යමින් පැවති අතර ඉතිරි පවුල් 113 දෙනාගේ නැවත පදිංචි කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | අධි අවධානම් ප්‍රදේශවල ජීවත්වන පවුල් හැකිතරම් කඩිනමින් සුදුසු ස්ථානයන්හි පදිංචි කරවීමට පියවර ගත යුතුය. | නැවත පදිංචි කරවීම සඳහා 120 ක් හඳුනාගෙන ඇතත් මූලික වටයේ 07 ක් වෙනුවෙන් වන්දි ගෙවීම් අනුමත වී ඇත. ඉතිරි පවුල් නැවත පදිංචි කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. |
| (ඉ) | පදිංචිය හා කෘෂිකාර්මික කටයුතු සඳහා පරම්පරාවෙන් අනවසර ඉඩම් අල්ලාගත් අනවසරකරුවන් 07 දෙනෙකු සම්බන්ධයෙන් තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන් විසින් දෙසතියකට වරක් ප්‍රාදේශීය ලේකම් දැනුවත් කළ යුතු අතර එය නියමිත ආකාරයෙන් සිදුවන්නේද යන්න පිළිබඳව පරීක්ෂා කර ඒ පිළිබඳ දැනගත් විගසම ඉඩම නිරවුල් කිරීමට කටයුතු කළ යුතු අතර එසේ නොමැති විට අදාළ ඉඩම් බදුපදනම (වාර්ෂික,දීර්ඝකාලීන) මත ලබාදී රජයට ආදායමක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. | ඉඩම් කච්චේරියක් පැවැත්වීමට සැලැසුම් කර ඇති අතර, ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |
| (ඊ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක | චක්‍රලේඛය අනුව කටයුතු කළ | වැඩිපුර ගෙවන ලද මුදල් |

| | | | |
|---|---|---|---|
| | මාණ්ඩලික නොවන නිලධාරීන් 06 දෙනෙකු විසින් අනුමත නිවාඩු දින (1/20)ඉක්මවා දින 10ක් වෙනුවෙන් නිවාඩුදින වැටුප්වශයෙන්රු.12,302 ක් ලබා ගෙන තිබුණි. | යුතුය. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (උ) | වී මිල දී ගැනීම සඳහා මිණිපේ සමුපකාර සමිතිය වෙත ලබා දී තිබූ රු.4,303,617 ක අත්තිකාරම් මුදලින් 2018 දෙසැම්බර් 31 දින වන විට රු.1,771,687 ක මුදලක් අයවීමට පැවැතුණි. | රාජ්‍ය ගිණුම් කාරක සභා තිරණ අනුව මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදි ප්‍රගතිය සමාලෝචනය කරනු ලැබේ. |

4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

---

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රයට අනුව යමින් තිරසර සංවර්ධන අරමුණු සැලැසුම් සකස් කිරීමක් සිදු කර නොතිබුණි. | එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය අනුව ශ්‍රී ලංකා රජයද වසර 2030 වන විට තිරසාර සංවර්ධනය අරමුණු ළහා කර ගැනීම සඳහා සුදානම් වෙමින් සිටින බැවින් සියළු රාජ්‍ය ආයතනවල දායකත්වය මේ සඳහා අවශ්‍ය වේ. | විගණන කළමනාකරණ කමිටුවේදී පිළිගන්නා ලද අතර, ඒ පිළිබඳ අවධානය යොමු කරන බව පවසන ලද අතර, 2019 සැලැස්මට ඇතුළත් කරන ලදි. |

5. යහපාලනය

---

මහජනයා වෙත සේවා ඉටු කිරිම

---

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තොරතුරු දැනගැනීමේ පනත අනුව යම් ඉල්ලීමක් ලද විගස අදාළ නිලධාරියා විසින් එම ඉල්ලීමලද බව දැන්විය යුතු අතර, දින 14 ක් ඇතුළත තොරතුරු සැපයීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ යුතු වුවද, ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 ක ඉල්ලීම ලද බව දන්වා යවා නොතිබූ අවස්ථා 03 ක් ද තොරතුරු සැපයූ හෝ ප්‍රතික්ෂේප කළ අවස්ථා 08 ක් සම්බන්ධයෙන් ප්‍රමාදය දින 26 සිට දින 357 ක් දක්වා පරාසයක පැවතුණි. | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ 24(3) හා 25(1) වගන්තිය අනුව කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල තොරතුරු ඉල්ලීම සම්පූර්ණ කිරීම සඳහා කාල ප්‍රමාදයක් ගතවී ඇත. |

6. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------- | ---------- | ------------- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 307 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි. | යහපත් සේවාවක් පවත්වාගෙන යාම සඳහා පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. | ත්‍රෛයි මාසිකව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට පුරප්පාඩු යොමු කරනු ලැබේ. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දින වන විට මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20 ක් තුළ ග්‍රාම නිලධාරී වසම්1187 ක ග්‍රාම නිලධාරී පුරප්පාඩු 74 ක් පැවතුණි. | යහපත් සේවාවක් පවත්වාගෙන යාම සඳහා පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ග්‍රාම නිලධාරීන් බඳවාගනු ලැබේ. |